## “සුපිළිපන් බව වැඩිදියුණු කරමු – අල්ලස හා දූෂණය පිටුදකිමු”

## උතුරු මැද පළාත් ඩිජිටල් නිර්මාණ තරඟාවලිය - 2026

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර කටයුතු ඒකකය මගින් මෙහෙයවනු ලබන, “සුපිළිපන් බව වැඩිදියුණු කරමු – අල්ලස හා දූෂණය පිටුදකිමු” යන තේමාව යටතේ පැවැත්වෙන ඩිජිටල් නිර්මාණ තරඟාවලිය සඳහා පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, වෘත්තීය පුහුණුලාභීන්, තරුණ තරුණියන් සහ සමාජ ක්‍රියා කාරීන්ගෙන් නිර්මාණ අපෙක්ෂා කෙරේ.

මෙම තරගාවලිය සඳහා යොදා ගත හැකි තාක්ෂණික උපකරණ වනුයේ full HD Camera, DSLR Camera, Smart Phones, AI මෘදුකාංග ආදිය වේ.

### තරගය සඳහා යෝජිත අංශ

තරුණ තරුණියන්ට තමන්ගේ දක්ෂතාව අනුව තරග කළ හැකි පරිදි පහත අංශ පහ යෝජිත වේ.

### 01. ඩිජිටල් කෙටි වීඩියෝ තරගය (Digital Short video competition)

යෝජිත කාලය: තත්පර 30–90
මෙම කෙටි වීඩියෝ තරඟය තරඟ ඉසව් තුනකින් සමන්විත වේ.

- DSLR (Full HD 1920 x 1080) තාක්ෂණය යොදාගෙන සකස් කරන වීඩියෝ පට.
- Smart phone - සුහුරු ජංගම දුරකතන යොදාගෙන සිදු කරන වීඩියෝ පට.
- AI Creation Software - කෘතිම බුද්ධිය තාක්ෂණය යොදා ගනිමින් නිර්මාණය කරන වීඩියෝ පට.

අල්ලස ප්‍රතික්ෂේප කිරීම, අවංක රාජ්‍ය සේවය සහ දූෂණයෙන් තොර සමාජයක් පිළිබඳ වීඩියෝවක් නිර්මාණය කළ යුතු වේ.

### 02. ඩිජිටල් පෝස්ටර් (Digital Poster Competition)

අල්ලස හා දූෂණය වැළැක්වීම, සුපිළිපන් බව සහ මහජන වගකීම පිළිබඳ පණිවිඩයක් දෘශ්‍ය නිර්මාණයකින් ඉදිරිපත් කළ යුතුය.

### 03. ඩිජිටල් සජීවිකරණ තරගය (Digital Animation Competition)

කෙටි කාටූන්, සජීවිකරණ හෝ ඩිජිටල් කථාන්දර මඟින් සදාචාරාත්මක පණිවිඩයක් නිර්මානය කල යුතුය.

## 04. සමාජ මාධ්‍ය ඩිජිටල් ප්‍රචාරණ තරගය (Social Media Digital Publicity Competition)

අවංකභාවය සහ අල්ලස් විරෝධී ආකල්ප ප්‍රවර්ධනය සඳහා නිර්මාණාත්මක ඩිජිටල් ප්‍රචාරණ ව්‍යාපාරයක් සැලසුම් කිරීම සිදු කල යුතුය.

## 05. ඩිජිටල් නවෝත්පාදක අදහස් තරගය (Digital Innovation Opinion Competition)

අල්ලස හා දූෂණය අවම කිරීමට, රාජ්‍ය සේවාවල විනිවිදභාවය වැඩි කිරීමට හෝ මහජන පැමිණිලි පහසු කිරීමට තාක්ෂණික විසඳුම් යෝජනා කිරීම, මෙහිදි අපේක්ෂා කෙරේ.

## <u>තරග අංශ අනුව අමතර නිර්ණායක</u>

පොදු නිර්ණායකවලට අමතරව, අංශයට ගැළපෙන තාක්ෂණික ඇගයීමක්ද යොදාගැනේ.

| තරග අංශය | විශේෂයෙන් ඇගයීමට ලක්කළ යුතු කරුණු |
|---|---|
| ඩිජිටල් කෙටි වීඩියෝ | කථා ව්‍යුහය, රංගනය, කැමරාකරණය, සංස්කරණය සහ හඬපටය |
| ඩිජිටල් පෝස්ටර් | දෘශ්‍ය සංයෝජනය, වර්ණ භාවිතය, අකුරු කියවීමේ පහසුව සහ තොරතුරු පෙළගැස්ම |
| සජීවිකරණ කථන්දර | චරිත හා දර්ශන අඛණ්ඩතාව, චලනය, කථා ඉදිරිපත් කිරීම සහ හඬ ගැළපීම |
| සමාජ මාධ්‍ය ප්‍රචාරණය | ඉලක්කගත අපේක්ෂකයා, පණිවිඩ අඛණ්ඩතාව, ප්‍රවේශ විය හැකි බව සහ ප්‍රචාරණ සැලැස්ම |
| ඩිජිටල් නවෝත්පාදක අදහස් | ගැටලුව හඳුනාගැනීම, විසඳුමේ ප්‍රායෝගිකත්වය, පරිශීලන පහසුව සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව |

## <u>තරග නීති හා කොන්දේසි</u>

01. තරගයට ඉදිරිපත් කරන නිර්මාණය තරගකරුගේ/කණ්ඩායමේ මුල් නිර්මාණයක් විය යුතු අතර, වෙනත් තරගයකින් හෝ ප්‍රකාශිත මූලාශ්‍රයකින් අවසරයකින් තොරව පිටපත් නොකළ යුතුය.
02. DSLR (Full HD) සහ Smart Phone (සුහුරු ජංගම දුරකතන) භාවිතයෙන් සිදු කරන නිර්මාණයන් සඳහා AI තාක්ෂණය යොදා ගත නොහැක.
03. කෘතිම බුද්ධි මෘදුකාංග (AI Creation Software, කෘතිම බුද්ධි තාක්ෂණික නිර්මාණ (AI Creations සඳහා පමණක් යොදා ගැනීමට අවසර ලැබේ.)
04. අන් අයගේ ඡායාරූප, හඬ, වීඩියෝ, සංගීතය, ලාංඡන හෝ වෙනත් කෘති භාවිත කරන විට අවශ්‍ය අවසර සහ බලපත්‍ර ලබාගත යුතුය.

05. පුද්ගලයන් හඳුනාගත හැකි ඡායාරූප/වීඩියෝ සඳහා අදාළ අනුමැතිය ලබාගත යුතුය. බාලවයස්කරුවන්ගේ දර්ශන සඳහා දෙමාපිය/භාරකරුගේ අවසරය අත්‍යවශ්‍ය වේ.

06. සත්‍ය පුද්ගලයන්ට හෝ ආයතනවලට එරෙහිව සාක්ෂි රහිත චෝදනා, අපහාසාත්මක ප්‍රකාශ හෝ පෞද්ගලික තොරතුරු ඇතුළත් නොකළ යුතුය. අවශ්‍ය නම් ප්‍රබන්ධ චරිත සහ අවස්ථා භාවිත කළ හැකිය.

07. නිර්මාණය අදාළ තේමාවට සම්බන්ධ විය යුතු අතර වෛරී, ප්‍රචණ්ඩ, වෙනස්කම් කරන හෝ නීතිවිරෝධී අන්තර්ගත ඇතුළත් නොවිය යුතුය.

08. නිර්මාණයේ භාෂාව සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි විය හැකිය.

09. ජයග්‍රාහී නිර්මාණ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිත කිරීමට අභ්‍යන්තර කටයුතු ඒකකය තීරණය කරන්නේ නම්, (නිර්මාණකරුගේ අයිතිය රැකෙන පරිදි) භාවිත අරමුණ සහ අවසරය ලිඛිතව ලබා දීමට කටයුතු කළ යුතුය.

10. මෙම තරගය සඳහා ඕනෑම ඉසව්වකින් නිර්මාණ ඉදිරිපත් කළ හැකි අතර, එක් නිර්මානකරු හෝ කණ්ඩායම විසින් තරග ඉසව් 3ක් සඳහා පමණක් නිර්මාණය ඉදිරිපත් කළ හැකිය.

11. තරගය සඳහා ඉදිරිපත් කරන නිර්මාණය නීතිමය ගැටලුකාරී අන්දමෙන් හෝ පවතින නීතිමය තත්වයන්ට පටහැනි ආකාරයෙන් ඉදිරිපත් නොකළ යුතුය. නීතිමය තත්වයතට මුහුණදීමට සිදුවුවහොත් උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර කටයුතු ඒකකය වග කියනු නොලබයි.

12. නිර්මාණය 2026.11.30 පෙර ලැබෙන පරිදි ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවියේ අභ්‍යන්තර කටයුතු ඒකකය විසින් පළ කර ඇති දැන්වීමට අනුකූලව ලබා දිමට කටයුතු කළ යුතුය.

13. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමයන්ට නොගැළපෙන ඉදිරිපත් කිරීම් කිසිදු දැනුම් දීමකින් තොරව තරග ඉසව්වෙන් ඉවත්කරනු ලබයි.

## විනිශ්චය සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය

පහත නිර්ණායක සියලුම තරග අංශ සඳහා පොදු මූලික ඇගයීම් රාමුවක් ලෙස භාවිතා කෙරේ. අවශ්‍ය වන පරිදි තරග අංශයට අදාළ තාක්ෂණික නිර්ණායක වෙනම එක් කරනු ලබයි.

මුළු ලකුණු: 100

1. තේමාවට අදාළත්වය - ලකුනු 20 ("සුපිළිපන් බව වැඩිදියුණු කරමු – අල්ලස හා දූෂණය පිටුදකිමු" යන තේමාව නිවැරදිව නිරූපණය කිරීම.)
2. නිර්මාණශීලීත්වය හා නව්‍යතාව - ලකුණු 15
3. නව අදහස්, සුවිශේෂී ඉදිරිපත් කිරීම සහ සාම්ප්‍රදායික චින්තනයෙන් ඔබ්බට යාම. පණිවිඩයේ පැහැදිලි බව හා බලපෑම - ලකුණු 15
4. ප්‍රේක්ෂකයාට පහසුවෙන් තේරුම් ගත හැකි, මතකයේ රැඳෙන සහ යහපත් හැසිරීමකට පෙළඹවිය හැකි පණිවිඩයක් තිබීම. - ලකුණු 15
5. ඩිජිටල් තාක්ෂණ භාවිතය - වීඩියෝ, ග්‍රැෆික්, සජීවිකරණ, ශබ්ද, සංස්කරණ හෝ සුදුසු ඩිජිටල් මෙවලම් කාර්යක්ෂමව භාවිත කිරීම. - ලකුණු 10

6. තාක්ෂණික ගුණාත්මකභාවය - රූප පැහැදිලි බව, ශබ්ද ගුණාත්මකභාවය, අකුරු කියවීමේ පහසුව, සංස්කරණය සහ නිමාව. - ලකුණු 10
7. තරුණ සහභාගිත්වය හා සමාජ ප්‍රයෝජනය - තරුණයන්ගේ දායකත්වය, ප්‍රජාව දැනුවත් කිරීමේ හැකියාව සහ සමාජයට ඇති ප්‍රයෝජනය. - ලකුණු 5
8. භාෂා භාවිතය හා ඉදිරිපත් කිරීම නිවැරදි භාෂාව, සුදුසු වචන, පණිවිඩයේ අනුපිළිවෙළ සහ ඉදිරිපත් කිරීමේ ආකර්ෂණය. නීතිමය හා සදාචාරාත්මක අනුකූලතාව - ලකුණු 10

## තරග කරුවන් සඳහා ත්‍යාග

ඩිජිටල් නිර්මාණ සම්බන්ද විශේෂඥයින්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයකින් තරග ඉසව් සඳහා පළමු වැනි, දෙවැනි, තුන්වැනි ස්ථානයන් සහ විශේෂ කුසලතා යනුවෙන් 7 තෝරාගනු ලබයි.

පළමු ස්ථානය - රු.20,000/=

දෙවැනි ස්ථානය - රු.10,000/=

තුන්වැනි ස්ථානය - රු.5,000/=

විශේෂ කුසලතා 7ක් සඳහා සහතික පත්‍ර පිරිනමණු ලබයි.

**තරගය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය.**

ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවිය මගින් පළකර ඇති  දැන්වීමේ සඳහන් QR SCAN කර Google සබැඳියට පිවිසීමෙන්  තරගය සඳහා නිර්මාණය ඉදිරිපත් කළ හැකිය.

https://docs.google.com/forms/d/e/1FAIpQLSceBr6fQUSQgrM0S-6d3UwcGEdPJ3dEgZMQXyy6NleK4fvIkg/viewform?usp=header

අභ්‍යන්තර කටයුතු ඒකකය,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

උතුරු මැද පළාත - අනුරාධපුර.

2026.10.19